# බළන්ගොඩ නගර සභාව

## 2021-04-06 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.04.06**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ජී.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-03-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2021-03-16 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2021-03-23 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් 2021-03-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2021-03-16 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2021-03-23 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින්, 2021-03-09 දින මහ සභා වාර්තාවේ සංශෝධනයක් ලෙස 37 පිටුවේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්වල ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් කරන ලද කථාවේ අවසාන පේළියට උඩින් ඇති පේළියේ සටහන්ව ඇති 'ආණ්ඩුකාරතුමා හා මන්ත්‍රීවරුන් 17 දෙනා ඉදිරියේ ලේකම්තුමියගේ වැරදි පැවසූ බවද' යන ප්‍රකාශයේ අර්ථය වැරදි අතර එය 'ගරු ආණ්ඩුකාරතුමා ඉදිරියේ සභාපතිතුමාගේ වැරදි පැවසූ බව' යනුවෙන් නිවැරදි විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ලිඛිතව දන්වා ඇති බව සඳහන් කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා ගරු සභාවේ සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- මැතිවරණ කොමසාරිස්තුමා විසින් ගැසට් නොකිරීම හේතුවෙන් අද දින සභාව සඳහා සහභාගි වීමට නොහැකි වුවද අභිනවයෙන් තේරී පත්වූ නවක මන්ත්‍රීවරිය වෙත ප්‍රථමයෙන් සුභ පැතුම් එක් කරන ලදී.
- එමෙන්ම අද දින සභාව අවසන් වීමෙන් අනතුරුව බළන්ගොඩ නගර සභා තානායමේ සූදානම් කර ඇති දිවා භෝජන සංග්‍රහය සඳහා සහභාගි වන ලෙස ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීවරුන්ටත් මාධ්‍යවේදී සියලු දෙනාටත් ආරාධනා කරන ලදී.
- බොහෝ විට වර්ෂයක් ඇතුළත පළාත් පාලන මැතිවරණය පැවැත්විය හැකි බවද පළාත් සභා මැතිවරණයට පෙර පළාත් පාලන මැතිවරණය පැමිණිය හැකි බව රජයේ අභ්‍යන්තර විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් දැනගන්නට ලැබූ බවද එක් නීතිඥ මහත්මයෙක් අයවැය පරාජය කර

පැමිණෙන ලෙසත් ඉතිරිය තමන් බලා ගන්නා බවත් පවසා තිබුණද එම නීතිඥ මහතා එයින් පසුව සොයා ගැනීමට හෝ නොහැකි වූ අතර එයින් පාඩුව සිදුවූයේ සභාවේ මන්ත්‍රීවරුන්ට හා නගර සභාවට බදු ගෙවන බළන්ගොඩ ජනතාවට බවද පවසන ලදී. මේ වන විට සභාවට දැරිය හැක්කේ පුනරාවර්තන වියදම් පමණක් වන බැවින් සභාවෙන් ඉටු වීමට තිබූ සංවර්ධන කටයුතු නතර වූ බවද රුපියල් ලක්ෂ 300 ක පමණ සංවර්ධන කටයුතු ආරම්භ කර තිබිය යුතු බවද ගම්පෙරළිය යටතේ මාර්ග විශාල කොටසක් සංවර්ධනය වූ බවද පැවසීය. එමෙන්ම පවතින රජය මඟින් සියලු මාර්ග කාපට් කරමින් පවතින අතර ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වීම නිසා මෙම වරප්‍රසාද ලැබුණු බවද එම ව්‍යාපෘතිවල ප්‍රමිතියේ අඩුවැඩිකම් හොඳ නොහොඳකම් පවතින අතර මන්ත්‍රීවරුන් එය දන්නා බව ද පවසන ලදී. තමන් ඡන්දයෙන් පත්කර එවූ මන්ත්‍රීවරුන් තමන්ගේ බදු මුදලින් සිදු කරන්නේ කුමක්ද කියා මහජනතාව බලා සිටින බැවින් අයවැය සම්බන්ධ කුමන තීරණය පැමිණියද එතෙක් ගරු මන්ත්‍රීවරුන්ගේ ලක්ෂ 05 යෝජනා ඉටු කිරීම සඳහා විශේෂ සභාවක් හෝ කැඳවා මෙය අනුමත කර ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවද පවසන ලදී.

- පසුගිය සභා වාරයේ කාරක සභා අවස්ථාවකදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ආදායම හා වියදම ගැන විස්තර විමසූ බවද එහි උප කාර්යාලයක් ආරම්භ කළ පසු හා ඊට පෙර බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ප්‍රගතිය අද දින සභාවේදී ඉදිරිපත් කරන බවද පවසන ලදී.

**2020 ජනවාරි සිට 2020 සැප්තැම්බර් දක්වා ආදායම**

| **මාසය** | **කොම්පෝස්ට්** | **අබිලි ද්‍රව්‍ය** | **මාසික එකතුව** |
|---|---:|---:|---:|
| මැයි | 78,200.00 | 49,712.00 | 127,912.00 |
| ජූනි | 11,625.00 | 51,929.00 | 63,554.00 |
| ජූලි | 92,724.00 | 49,725.00 | 142,449.00 |
| අගෝස්තු | 102,582.00 | 19,591.00 | 122,173.00 |
| සැප්තැම්බර් | 211,248.00 | 36,400.00 | 247,648.00 |
| **එකතුව** | **496,379.00** | **207,357.00** | **703,736.00** |

**2020 ඔක්තෝම්බර් 26 සිට 2021 මාර්තු 31 දක්වා ආදායම**

| **දිනය** | **කොම්පෝස්ට්** | **අබිලි ද්‍රව්‍ය** | **එකතුව** |
|---|---:|---:|---:|
| 2020.10.20 - 2020.10.29 | 16,500.00 | 92,021.00 | 108,521.00 |
| 2020.11.02 - 2020.11.30 | 75,720.00 | 123,403.60 | 199,123.60 |
| 2020.12.02 - 2020.12.31 | 66,930.00 | 193,823.25 | 260,753.25 |
| 2021 ජනවාරි | 96,875.00 | 128,155.75 | 225,030.75 |
| 2021 පෙබරවාරි | 62,125.00 | 179,510.20 | 241,635.20 |
| 2021 මාර්තු | 100,500.00 | 148,012.85 | 248,512.85 |
| **එකතුව** | **418,650.00** | **864,926.65** | **1,283,576.65** |

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අසනීප තත්ත්වයේ සිටින බැවින් අද දින සභාව සඳහා සහභාගි නොවිය හැකි බව දන්වා ඇති අතර එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන බව පවසන ලදී.
- දැනට රටේ පවතින කොරෝනා තත්ත්වය හේතුවෙන් නගරයට පැමිණෙන මහජනතාව අඩු වී ඇති බැවින් තමා විසින් නගර සභාව වෙත ගෙවන නඩත්තු මුදල හා ජල බිල්පත් ගෙවීමට අපහසු බව පවසා අය කරන ගාස්තුව රු.10 සිට රු.20 දක්වා වැඩි කර දෙන ලෙස පොදු වැසිකිළි ටෙන්ඩර්කරු වන කේ.වාලට් මහත්මිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙසේ ලබාදුනහොත් ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කිරීමක් සිදුවන බැවින් ලබාදිය නොහැකි බව පවසන ලදී.

- සෝ ගාතකාගාරයක් ආරම්භ කිරීමට සුදුසු ඉඩමක් කුමාරගම පදිංචි පාහිම් හාජියාර් විසින් තමන් වෙත ලබා දී ඇති අතර තව දින ගණනාවකින් රාමසාන් උපවාස මාසය ආරම්භ වීමට නියමිත බැවින් මෙම ස්ථානයේ තාවකාලික සෝ ගාතකාගාරයක් පවත්වාගෙන තමා හට බලපත්‍රයක් ලබා දෙන ලෙස අංක 30/5, රන්දොල, කිරිමැටිතැන්න, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.එම්.නජීම් යන අය විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් මෙය තමන්ගේ නිවස අසළ ඉඩමක් වන අතර කුමාරගම වසමේ මෙවැනි දෙයක් සඳහා අවසර ලබා දීම පිළිබඳ තමන් තරයේ විරුද්ධ වන බව ද අවශ්‍යනම් වෙනත් ඕනෑම කොට්ඨාශයක මේ සඳහා අවස්ථාව ලබා දෙන ලෙසද පවසන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් අද දින මෙය න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කර නොමැති බැවින් සභාවේ තීරණයක් ගත නොහැකි බවද එමෙන්ම මේ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු බවද පවසන ලදී.

- කසුන් මධුසංක යන අය විසින් නිවසේ අප ජලය ඉවත් කිරීමට කාණුවක් නොමැති බැවින් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ I GYM කායවර්ධන ආයතනය මඟින් සංවිධානය කරන සුහද ක්‍රිකට් තරඟාවලිය අප්‍රේල් මස 10 වන දින හෝ 11 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇති බැවින් ඒ සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඒ අනුව මේ සඳහා අවසර ලබා දීමට සභාව විසින් තීරණය කරන ලදී.

- කරව්කැටිය පාරේ අංක 34, 34/2, 34/3 යන නිවාස ඒකක අයත් ඉඩම් කොටස් වැසි දිනවලදී කරව්කැටිය මාර්ගය දිගේ හා මාර්ගයට ඉහළ ඉඩම්වලින් ගලා එන වැසි ජලය හේතුවෙන් ජලයෙන් පිරී පීඩාවට පත්වන අතර මෙය උග්‍ර වී ඇත්තේ මෙම මාර්ගය කාපට් කිරීමේ කටයුතු ආරම්භ කර කලින් පැවති මාර්ගය උස් කර සකස් කිරීම නිසා බවද මෙම මාර්ගයේ කාණු පද්ධතියක් නොමැති එකම ස්ථානය මෙය බවද එබැවින් කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස එම නිවෙස් හිමියන් විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ ප්‍රදේශයේ මිරිස්වත්ත ග්‍රාමයේ නගර සභා සීමාවට අයත් අලාබ්දීන් මාවත ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර මෙම පටුපාර දෙපස නිසි පරිදි කාණු පද්ධතියක් නොමැති බවත් වර්ෂා කාලයේදී ජලය පාර මතින් ගලා ඒම හේතුවෙන් පාරේ තැනින් තැන වලවල් හැරී ඇති අතර කාණු පද්ධතිය සහිතව මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලෙසත් ඉල්ලා එම්.එච්.එම්.කලීල් මහතා විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- 11/4/ඒ, කොටුව පෙදෙස, කොටුගොඩැල්ල පාර, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ගාමිණී අනුර වීරසේකර මහතා විසින් එම ප්‍රදේශයේ තනා ඇති අක්‍රමවත් ජල කාණුව (බෝක්කුව ආශ්‍රිතව) පිළිසකර කර යථා තත්ත්වයට පත් කර දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- බළන්ගොඩ නව මහජන පොළෙහි වසර 30-35 ක සිට වෙළෙඳාම් කරන වෙළෙඳුන් විසින් නව මහජන පොළෙහි කඩ කාමර ඉල්ලමින් හා දැනට කඩවල් ඇති අය සඳහා විදුලිය ලබා දෙන ලෙසද එසේ විදුලිය දුනහොත් එම විදුලි බිල්පත් ගෙවන බවද එසේ නොමැතිව එක් බිල්පතක් ලැබෙන්නේ නම් එම මුදල සමව ගෙවන බවද දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04.01 පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම.

පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරය සඳහා කිසිදු ලංසුපතක් නිකුත් නොවූ අතර ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මහ සභාව මඟින් තීරණය කිරීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**05. කල් දී ඇති යෝජනා**

**05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05ඃ01ඃ01 පෙර පාසල් සිසුන්ගේ රුක්රෝපණය සඳහා ළමා එළිමහන් ක්‍රීඩා පිටිය සඳහා අවශ්‍ය ටයිටේනියම් මල් පෝච්චි මිළදී ගැනීම වෙනුවෙන් රු.39,000.00ක මුදලක් සබරගමුව ගොවි සේවා ආයතනය සඳහා ගෙවීම් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:02 වාර්ෂික නිළ ඇඳුම් දීමනාව ලබා දීම සඳහා රු.84,000.00 ක් (4,000.00 x 21) මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 බැංකියවත්ත සේවකයින් වෙත අලුත් අවුරුද්ද සඳහා ලබා දෙන රු.5,000.00 ක උපරිමකට යටත්ව පෝෂණ මලු 25 ක් ලබා දීම රු.125,000.00 ක මුදලක් සඳහා අනුමැතිය ඉල්ලා සිටීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:04 රු.10000.00ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- බැංකියවත්ත සේවකයින් සඳහා අවශ්‍ය බූට්ස් හා ග්ලවුස් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.17,050.00 ගෙවීම.
- බැංකියවත්ත කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය දුගඳ නාශක මිළදී ගැනීම වෙනුවෙන් යුනයිටඩ් ග්ලාස් ලංකා ආයතනය වෙත රු.162,000.00 ක මුදලක් ගෙවීම.
- CFL Screw 30W බල්බ් 200 ක් මිළදී ගැනීම වෙනුවෙන් ඔරේන්ජ් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත රු.132,639.00 මුදලක් ගෙවීම.
- පෙර පාසල් සඳහා අවශ්‍ය තෑගි මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.22,165.00 ක මුදලක් ගෙවීම.
- කර්මාන්ත අංශයේ අවශ්‍යතා වෙනුවෙන් ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනය වෙත රු.92,105.00 ක මුදලක් ගෙවීම.
- බිතු කැටයම් ස්ථානය සඳහා මල්පෝච්චි මිළදී ගැනීම වෙනුවෙන් සංකල්පා ආයතනය වෙත රු.10,200.00 ක මුදලක් ගෙවීම.
- කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය උදලු 10 ක් මිළදී ගැනීම වෙනුවෙන් සරණි පික්චර් පැලස් ආයතනය වෙත රු.16,000.00 ක මුදලක් ගෙවීම.
- සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය ලයිෆ්බෝයි සබන් මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.56,000.00 ක මුදලක් ගෙවීම.
- GK 6227 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ ඉංජිනියරින් ආයතනය වෙත රු.17970.00 ක මුදලක් ගෙවීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ05 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-03-03 | සභාපති, අසරණ සරණ වැඩිහිටි සමිතිය - ගලපල්ලෙඅරාව කොළණිය මාර්ගයේ රුඳවුම් බැම්ම ඉදිකිරීමට අදාළ බිල්පත ගෙවීම. | 30 | 049245 | 1,048,515.05 |
| 2021-03-08 | Dialog broadband Net. Pvt Ltd (Pv 261) | 34 | 049249 | 29,729.80 |
| | සම්පත් පියස කම්කරු සඳහා වැටුප් ගෙවීම | 36-2 | 049251 | 24,300.00 |
| | බැංකියවත්ත පොහොර හැලීම හා කසළ තේරීම වෙනුවෙන් වැටුප් ගෙවීම | 36-3 | 049251 | 46,150.00 |
| | බැංකියවත්ත පොලිතීන් තේරීම | 36-4 | 049251 | 55,900.00 |
| | සුසාන භූමි නඩත්තුකරු දීමනා ගෙවීම | 36-5 | 049251 | 20,000.00 |
| | දෛනික වැටුප් | 36-11 | 049251 | 898,359.50 |
| | දෛනික වැටුප් | 36-12 | 049251 | 318,522.21 |
| | ජාසින්කන්ද ගැමුණු වැඩිහිටි සමිතිය - කොටුගොඩැල්ල ගල්වල මාර්ගයේ අවශ්‍ය ස්ථාන පෙරනිම් මිශ්‍රණය යොදා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් මුදල් ගෙවීම. | 37 | 049270 | 49,032.45 |
| | සුභසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - මහජන බැංකුව අසළ බිතු කැටයම් නිර්මාණය සඳහා තාප්පය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් මුදල් ගෙවීම. | 38 | 049217 | 36,000.00 |
| 2021-03-12 | සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - 2021 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 07,15,16 කඩ කාමර සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීමට ලංසුපත් කැඳවීම වෙනුවෙන් 2021-01-12 තිනකරන් පුවත්පතේ පළ කිරීම. | 49 | 049278 | 33,696.00 |
| | සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම - 2021 වර්ෂය | 50 | 049278 | 33,048.00 |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා පොදු වෙළෙඳසැල අංක 7,15,16 කඩ කාමර සඳහා ලංසුපත් කැඳවීම වෙනුවෙන් 2021-01-12 දිනමිණ පුවත්පතේ දැන්වීම් පළ කිරීම. | | | |
| 2021-03-16 | අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - දුනුමඩලගහවත්ත මාර්ගයේ පුලුදු වූ තැන් පිළිසකර කර සකස් කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල ගෙවීම. | 63 | 049288 | 75,000.00 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2021 ජනවාරි හා පෙබරවාරි මස කාර්යාලය පොදු වෙළෙඳසැල, මහජන පොළ ජල බිල ගෙවීම. | 84 | 049302 | 38,241.18 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2021 පෙබරවාරි මස දොරවෙල ගබඩාව පොදු පොදු වෙළඳසැල මහජන පොළ ජලබිල්පත් ගෙවීම. | 85 | 049302 | 35,555.58 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2021 පෙබරවාරි බස්නැවතුම්පල ජල බිල්පත ගෙවීම. | 86 | 049302 | 43,222.50 |
| | සාමාන්‍යාධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය - 2021 පෙබරවාරි මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම. | 87 | 049303 | 28,367.80 |
| | Dialog broadband Net.Pvt Ltd (Pv261) | 90 | 049305 | 11,340.00 |
| 2021-03-22 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-03-01 සිට 2021-03-15 දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම. | 101 | 049312 | 320,050.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ06 2021-04-06 දින සිට 2021-05-11 දක්වා සභාවේ වාහන සඳහා අවශ්‍ය ඉන්ධන මිළදී ගැනීම සඳහා රු.444,180.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම (ඇමුණුම 01)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥07 කර්මාන්ත අංශයේ 2021 අප්‍රේල් හා මැයි මස සඳහා කම්කරුවන් 19දෙනෙකු සඳහා කොන්ත්‍රාත් පදනමේ කම්කරු වියදම් ලෙස රු.1,071,200.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.(ඇමුණුම 02)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥08 සෞඛ්‍ය අංශයේ සේවා සඳහා රු.2,895,726.00 මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. (ඇමුණුම 03)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥09 ND 5124 වෑන් රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් කොටස් Toyota Lanka (Private) Limited ආයතනය වෙතින් රු.43,908.16 ක ඇස්තමේන්තු මිළ යටතේ ලබාගෙන අදාළ සේවාව ලබා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| Shoe Kit Rear Brake | 01 | Rs.19,122.16 |
| Pad Kit Disc Brake (420) | 01 | Rs.24,786.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥10 බොබ් කැට් යන්ත්‍රයේ පහත සඳහන් අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනය වන C-Com Equipment ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු.102,492.00 ක මුදල ගෙවා අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| 01. Crank oil Seal | 01 | Rs.8600.00 |
| 02. Crank Sleeve | 01 | Rs.7200.00 |
| 03. Belt adjuster | 01 | Rs.59900.00 |

<u>Technical Charges & Other</u>

04. Technical Charges for Crank Seals replacement Rs.8500.00

05. Sundries Rs.1200.00

06.Transport charges Rs.9500.00

Vat 8% Rs.7592.00

Total Rs.102492.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:11 LL 7688 FOTON කෘෘ කැබ් රථයේ ගිලා බැස ඇති සීට් පුරවා වෙල්වට් රෙද්දෙන් සීට් කවර මැසීමට, තට්ටුවේ කාපට් එක මැසීමට, ඩෑෂ් බෝඩ් කවරය දැමීමට, කාපට් කෑලි පහත් දැමීම සඳහා ප්‍රසන්න කුෂන් වර්ක්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.38,500.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:12 QL 2901 ත්‍රීරෝද රථයේ ක්ලච් ප්ලේට් දැමීම හා කැබ් හෝල්ට් එකක් දැමීම සඳහා සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති පහත මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගෙන මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | මිළ රු. |
|---|---|---|
| Clutch Plate Set | 01 | 2490.00 |
| Presure Plate Set | 01 | 1140.00 |
| Clutch Springs | 06 | 300.00 |
| Clutch Cover packing | 01 | 750.00 |
| Clutch belt com.kit | 01 | 5200.00 |
| Clutch hub kit | 02 | 2480.00 |

| | | |
|---|---|---|
| Clutch outer | 01 | 690.00 |
| oil filter &packing | 01 | 320.00 |
| cabin | 01 | 4400.00 |
| oil | | 1390.00 |
| Repair Charges | | 1450.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:13 ZA 5326 මෝටර් ග්‍රේඩරය සහ ZA 9835 ගලි බවුසරය 2021/2020 වර්ෂ සඳහා රක්ෂණය කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ZA 5326 - රු.161957.58

ZA 9835 - රු.71832.45

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:14 බොබ් කැට් යන්ත්‍රයේ ටයර් 04 දැමීම සහ බකට් එකෙහි දිරාගිය කොටස් සාදා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:15 HF 8558 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ16 බැංකියවත්ත මළ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත රු.12,450.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ17 2021 අප්‍රේල් හා මැයි මස සඳහා ආපදා ණය, කාර්යසාධන හා උත්සව අත්තිකාරම් ණය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

**<u>ආපදා ණය ලබා ගැනීම.</u>**

**2021 අප්‍රේල්**

01. එච්.එච්.ඉරෝෂා සෙව්වන්දි මිය - රු.250,000.00 හා විශේෂ ඉල්ලීම් 01

**<u>2021 මැයි</u>**

01. නිල්මිණි මීගස්දෙණිය මිය - රු.250,000.00 හා විශේෂ ඉල්ලීම් 01

**<u>කාර්යසාධන ණය ලබා දීම.</u>**

01. ඩී.එම්.මාලනී සිරියලතා මිය - රු.100,0000 හා රු.500,000.00 ක මුදලකට යටත්ව ණය ගෙවීම.

**<u>උත්සව අත්තිකාරම් ලබා දීම.</u>**

01. ස්ථිර, අනියම්, ආදේශක, තාවකාලික සේවකයින් 160 සඳහා රු.10,000.00 බැගින් ලබා දීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ18 දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ19 2021-04-06 දින සිට 2021-05-11 දින දක්වා කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සඳහා රු.145,421.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.(ඇමුණුම 04)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ20 පෙර පාසල් පාලිකාවන් සිව් දෙනා වෙනුවෙන් මාසිකව රු.10,000.00 බැගින් 2021 මාර්තු හා අප්‍රේල් මාස සඳහා දීමනාව ලෙස රු.80,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. (ඇමුණුම 05)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නගර සභා පෙර පාසල වෙත බඳවා ගත් ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මියගේ දීමනාව ලබා දීමේ තත්ත්වය හා ස්ථිර කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විමසීම් කරන ලදී.

මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ21 2021 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවලට අදාළව විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.37,120.80 මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:22 2021 අප්‍රේල් මස හා මැයි මස සහික දීමනාව, දුරකථන දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස රු.762,000 ක මුදලක් ගරු මන්ත්‍රීවරුන් සඳහා ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:23 2021-04-06 දින සිට 2021-05-11 දක්වා සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක උපරිම මුදලකට යටත්ව වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:24 2021-04-06 දින සිට 2021-05-11 දින දක්වා හදිසි වාහන අලුත්වැඩියා කටයුතු සඳහා රු.150,000.00 ක උපරිමයකට යටත්ව වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:25 2021-04-06 දින සිට 2021-05-11 දින දක්වා හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක උපරිමයකට යටත්ව වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:26 ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරිනිය සඳහා පුටුවක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ27 බළන්ගොඩ නගර සභාවේ අප්‍රේල් මාසයට අදාළව ගෙවිය යුතු විදුලි බිල්පත් පියවීම සඳහා රු.100,350.00 මුදලක්ද ජල බිල්පත් පියවීම සඳහා රු.88,900.00 ක මුදලක්ද දුරකථන බිල්පත් පියවීම සඳහා රු. 36,465.19 ක මුදලක්ද වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. (ඇමුනුම 06)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ28 UQ 1933 යතුරු පැදියේ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ29 RD 8000 අංක දරණ ට්‍රැක්ටර් රථයේ පහත අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා චමින්ද ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු 25,110.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගෙන මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | |
|---|---|
| ට්‍රැක්ටර් රථයේ ඉදිරිපස වයර් පද්ධතිය ගලවා පිළිස්සුනු වයර් ඉවත් කර අලුතින් වයර් දමා වයරින් කිරීම,පිටුපස වයර් පද්ධතිය ගලවා පිළිස්සුනු වයර් බට ක්ලිප් දමා වයරින් කිරීම | - රු.15,000.00 |
| පිළිස්සුණු යතුරු ස්විච් එක ගලවා අලුතින් සවිකිරීම | - රු.1,350.00 |
| හෙඩ් ලයිට් බල්බ් එක දැමීම | - රු.750.00 |
| අලුතින් වයර් ස්විච් බට ක්ලිප් කේෂින් බට සඳහා යන වියදම ටේප් රෝල් හා කේබල් බට | - රු. 8,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ30 226-7521 ටිපර් රථයේ 2021-03-09 දිනැති මහ සභාවේ 05ඃ01ඃ11 යටතේ අනුමත කරන ලද අලුත්වැඩියාව සිදු කරගෙන යාමේදී එම ඇස්තමේන්තුවේ සඳහන්ව තිබූ ඕල්ටනේටර් ප්‍රෙෂර්

හෝස් එක ඕෆ් ලෝ හෝස් එක ජෙනුයින් දැමීම, පවර් ස්ටියරින් පොම්පය ජපන් (මාස 06 ක වගකීම් කාලයට යටත්ව), වම්පස දොර හා වින්ඩ්ව් සපයා සවිකිරීම යන අලුත්වැඩියා සඳහා නැෂනල් මෝටර්වේස් වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන වෙනස් වී නැවත ලබා දී ඇති රු.68,200.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ31 150w LED Cobra Street Lamp 50 ක් , Line tap 1000 ක් මිළදී ගැනීම සඳහා පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් 150w LED Cobra Street Lamp ලයිට් එකක් රු.8450.00 බැගින් ශක්ති එන්ටර්ප්‍රයිසස් වෙතින් ද Line tap එකක් රු.495.00 බැගින් සුගත් ඉලෙක්ට්‍රිකල්ස් වෙතින්ද මිළදී ගැනීම සුදුසු බවට නිර්දේශ කරන ලදී. ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ32 බළන්ගොඩ නගර සභා පෙර පාසලේ දරු දැරියන්ගේ අවුරුදු උළෙල 2021-04-30 වන දින පැවැත්වීමට සූදානම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය තෑගි ලබා ගැනීම සඳහා රු.31,950.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ33 56-1906 කෘෘ කැබ් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

01. පවර් ස්ටියරින් පොම්පේ හෝස් එක අලුතින් දැමීම.

02. රේඩියේටරේ කට අලුතින් දැමීම

03. ෆුට් බෝඩ් දෙක අලුතින් දැමීම.

04. ගුවන් විදුලි යන්ත්‍රයක් ලබාදීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ34 2021 අප්‍රේල් මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත නඩත්තු

1.පල්ලෙකුඹුර මාර්ගය තාර යෙදූ කොටස නඩත්තු කිරීම .

2.ගමගෙදර මාර්ගය නඩත්තු කිරීම.

3.මුගුණමලේ පාර තාර දමා නඩත්තු කිරීම.

4.බෝම්බුව ආචාරිමලේ මාර්ගය නඩත්තු කිරීම.

5.බෝම්බුව පෙරපාසලේ බිත්තිවල සහ ඩෙස්ක් පුටුවල තීන්ත ආලේප කිරීම.

6.සඳුන්ගම ධනසිරි මහතාගේ නිවසට යන මාර්ගයේ කාණුවල පස් ඉවත් කිරීමට ජේ.සී.බී.යන්ත්‍රය ලබාදීම.

7. බෝම්බුව ප්‍රජාශාලාවේ ආර්ථික සංවර්ධන නිළධාරි කාර්යාලය සඳහා කොටසක් ලෑලි ගසා වෙන්කර දීම.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය | ඒකකයක මිල රු. | සම්පූර්ණ මිල රු. |
|---|---|---|---|
| 1 1 /2 ගල් කියුබ් | 10 | 6800.00 | 68000.00 |
| 1/2 ගල් කියුබ් | 10 | 6500.00 | 65000.00 |
| වැලි කියුබ් | 10 | 10900.00 | 109000.00 |

| | | | |
|---|---|---|---|
| සිමෙන්ති බෑග් | 20 | 990.00 | 19800.00 |
| මි.මී.12 කම්බි | 20 | 795.00 | 15900.00 |
| මි.මී.10 කම්බි | 20 | 545.00 | 10900.00 |
| ABC කියුබ් | 10 | 6850.00 | 68500.00 |
| එකතුව | | | **357100.00** |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ35 ආවරණ අනුමැතියට යටත්ව පහත සඳහන් වියදම් දැරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

- ජල,විදුලි,දුරකථන බිල්පත් ගෙවීම සඳහා
- ඉන්ධන බිල්පත් පියවීම සඳහා
- දෛනික වැටුප් ගෙවීම සඳහා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ36 වීථි පහන් කටයුතු සඳහා අවශ්‍ය ඉනිමඟක් හා සේෆ්ටි බෙල්ට් එකක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ37 2021-04-06 දින සිට 2021-05-11 දින දක්වා නගර සභා නිළධාරීන්ගේ හා සේවකයින්ගේ නිවාඩු දින වැටුප්, අතිකාල ගෙවීම හා ගමන් වියදම් ගෙවීම සඳහා රු.300,000.00 ක උපරිමයකට යටත්ව වියදම් අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖38 බස්නැවතුම්පල සී 03 කඩ කාමරය කේ.එල්.හේමචන්ද්‍ර යන අය බදු ගෙන පවත්වාගෙන යනු ලබන අතර ඔහු විසින් ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා රු.4,000.00 ක මුදලක් තැම්පත් කරන ලදී. අනතුරුව ඔහු විසින් ජල සම්බන්ධතාවය ලබා ගැනීම අනවශ්‍ය බව දන්වා ඇති බැවින් එම තැම්පත් කරන ලද මුදල් නැවත ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖39 සභාව සතු දේපල (කිවුලෙවෙල ඉඩම) කේ.කේ.මිල්ටන් ජයකොඩි මහතාගේ ඉඩම අජිත් සුසන්ත විජේවික්‍රම යන අයට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖40 බුලත්ගම සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සුදුසු බිම් කොටසක් ලබා දිම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖41 බළන්ගොඩ නගර සභාවේ වරිපනම් තක්සේරු දැන්වීම් මුද්‍රණය කිරීම සඳහා වන වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම - රු.45,000.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖42 RC 1118 ට්‍රැක්ටරය සඳහා ඇම්පියර් 90 බැටරියක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖43 නව බස්නැවතුම්පල ඒ - 10 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙහි වර්ථමාන බදුකරු වන එම්.ආර්.එම්.ෂෆාන් මහතා විසින් එම්.වයි.ශාන්ත කුමාර යන අය වෙත අතුරු බදු ලබා දී ඇති බව අනාවරණය වී ඇති අතර ප.පා.කො. චක්‍රලේඛ 03/2020 පරිදි කටයුතු කරමින් මෙම කඩ කාමරයේ පෙර ගෙවුම් මුදලින් 25% ක මුදලක් සභාව වෙත ගෙවීමෙන් පසු අතුරු බදුකරු වන එම්.වයි.ශාන්ත කුමාර යන අයට මෙම කඩ කාමරය පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖44 මෝටර් ග්‍රේඩර් ක්‍රියාකරුගේ වැටුප් ගෙවීම (කාපට් ව්‍යාපෘතිය සඳහා කුලී පදනම මත ලබා දුන්) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම - රු.77,900.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ45 අංක 183/6 පදික කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් පවසා සිටියේ මෙහි වර්තමාන බදුකරු වන අංක 701 ඒ, මුගුණමලය, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි හෙට්ටි ආරච්චිගේ හර්ෂිත නවෝද් හෙට්ටිආරච්චි යන අය විසින් ලංකාබරණ වත්ත, දෙහිගස්තලාව, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ගලප්පත්තිගේ සමන් ලාල් යන අයට පවරා දීම සඳහා කැමැත්ත පළ කර සිටින බව පවසන ලදී.

ඒ අනුව රු.50,000.00 ක මුදලක් අය කර ගනිමින් ඉහත පදික කඩ කාමරය ගලප්පත්තිගේ සමන් ලාල් යන අයට පවරා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ46 අප්‍රේල් මස 13 වන දින පොදු වෙළෙඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය විවෘත කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. මන්ත්‍රී යෝජනා**

**06.01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06.01.01 බළන්ගොඩ නගර සභා කාර්ය මණ්ඩලය එක්ව කුරගල පුද භූමියේ ශ්‍රමදානයක් පැවැත්වීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022 වර්ෂයේ ජාතික වෙසක් උත්සවය පැවැත්වීමට නියමිත බැවින් මේ දිනවල සීඝ්‍ර සංවර්ධනයක් සිදු වන අතර බළන්ගොඩ රාජ්‍ය ආයතන බොහොමයක් ශ්‍රමදාන සූදානම් කර ඇති බැවින් නගර සභා කාර්ය මණ්ඩලය එක්ව ශ්‍රමදානයක් පැවැත්වීම සුදුසු බව පවසන ලදී. එමෙන්ම වැඩි පිරිසක් සහභාගි කර ගැනීම තුළින් ඵලදායි සේවාවක් ඉටු කිරීමට හැකියාවක් ලැබෙන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කර්මාන්ත කමිටුව මගින් නිර්දේශ කරන ලද යෝජනා**

**07ඃ01.ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

07ඃ01ඃ01 වැවේ ළිඳ මාර්ගය නඩත්තු කර සංවර්ධනය කිරීම.

07ඃ01ඃ02 අක්කර 18 පානීය ජල ව්‍යාපෘතිය සඳහා මාර්ග පළුදු කිරීම නිදහස් කිරීම සහ ජේ.සී.බී.යන්ත්‍රය ලබාදීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා**

07ඃ02ඃ01 පල්ලෙවෙල ගම කෙළවරෙහි ඇති බෝක්කුව පිළිසකර කිරීම.

07ඃ02ඃ02 බුලත්ගම ට්‍රාන්ස්ෆෝමරය අසලින් ඇති දෙවට පාරේ ආරම්භක කොටස ඉතාමත් අබලන් වී ඇති බැවින් එම කොටස කොන්ක්‍රීට් අතුරා ප්‍රතිසංස්කරණය කිරීම (දුර මීටර් 20)

මෙම නඩත්තු යෝජනා දෙකම වැඩ අධිකාරී මහතා විසින් ක්ෂෙත්‍ර පරීක්ෂණයක් සිදුකර නඩත්තු ලෙස සිදුකිරීමට සුදුසු නම් ඇස්තමේන්තු සකස් කිරීමට අනුමත විය.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කාර්මික නිලධාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

07:03:01 අනඳමෙත්ගම සිරිවර්ධන මහතාගේ නිවස අසල මාර්ගය නඩත්තු කිරීම.

07:03:02 අනඳමෙත්ගම පාරේ කාපට් කරන මාර්ගයේ වම්පස ඇති අඩියක් පමණ උස පස් තට්ටුව ඉවත් කිරීමට ජේ.සී.බී.යන්ත්‍රය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් අනඳමෙත්ම සිරිවර්ධන මහතාගේ නිවස අසළ මාර්ගයේ වලවල් හෑරී ඇති බැවින් එම මාර්ගය නඩත්තු කරන ලෙසද අනඳමෙත්ගම කාපට් කරන මාර්ගයේ ඇති ටෙලිකොම් කණු ඉවත් කිරීමට කටයුතු කරන ලෙසද පවසන ලදී.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මස සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04.ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07:04:01 හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ රණවිනාවත්ත මාර්ගයේ මීටර් 10ක පමණ කොටසක් සංවර්ධනය කිරීම.

07:04:02 බළන්ගොඩ නගරයේ ඇති දිරාගිය විදුලි ලී කණු ඉතා අබලන් බැවින් ඒවා ඉවත් කර කොන්ක්‍රීට් කණු සවිකරදෙන මෙන් විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීමක් කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් 07:04:02 යෝජනාව පිළිබඳ සභාව මඟින් විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ05.ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07ඃ05ඃ01 සිරි වීරසුන්දරාරාම මාවතේ පන්සල පාර කාණුවට කොන්ක්‍රීට් තහඩු 03ක් යොදා නඩත්තු කරදීම.

07ඃ05ඃ02 වීරසුන්දරාරාම මාවතේ කොන්ක්‍රීට් තහඩු දැමීමේදී හිදැස් ඇති හෙයින් අනතුරුදායක තත්වය වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම.

07ඃ05ඃ03 නගරයේ ස්ථාන කිහිපයක කොන්ක්‍රීට් තහඩු කැඩී වැටී ඇති හෙයින් හිදැස් පුරවා නඩත්තු කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම.

07ඃ05ඃ04 ක්‍රීඩාංගනය අවට වාහන නැවැත්වීම සඳහා අවට පරිසරය වතුර වලවල් වසා ABC යොදා වාහන නවත්වා පාරිභෝගිකයන්ට සහ වාහන හිමියන්ට වාහනයෙන් බැසීමට හැකි අයුරින් නඩත්තු කරදීම.(මෝටර් ග්‍රේඩරය හා ජේ.සී.බී යන්ත්‍රය යොදාගනිමින්)

07ඃ05ඃ05 ලංකා බැංකු මාවතේ ඇති පොරොත්තු බස්රථ ඉවත් කොට HNB ඉඩමේ ගාල් කර තැබීමෙන් එම ප්‍රදේශය වාහන හිමියන්ට වාහන හැසිරවීමට ලබාදීම.

07ඃ05ඃ06 ඉරිදා පොළේ ගඟබඩ මාර්ගයේ ඉතිරි කොටස් මට්ටම් කොට වාහන යා හැකි පරිදි නඩත්තු කරදීම.

07ඃ05ඃ07 කොටුගොඩැල්ල පාරේ අනුර මහතාගේ නිවස අසල අක්‍රමවත් ජලකාණුව සඳහා ගත් පියවර ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්ප්තිති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් තමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා කඩිනමින් ඉටු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ06 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

07ඃ06ඃ01 ගල්වල පාර බෝක්කුව සඳහා ආරක්ෂක අත්වැට ඉදිකිරීම - ඇස්තමේන්තු සකස් කර සභාවට ඉදිරිපත් කිරීමට අනුමත විය.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.ඩීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

**07:07:01** දුනුමඩලගහවත්ත මාර්ගයේ කරුණාදාස මහතාගේ නිවස දක්වා ඇති පැති කාණුව ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:07 ලිපි මඟින් ලැබෙන යෝජනා

07:7:01.අනතුරුදායක පොල් ගසක් පිළිබඳව .ඩී.එම් දයාල් සුමිත් මහතාගේ ලිපිය පරිදි කාර්මික නිළධාරී මහතා විසින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයට අදාළව අනතුරුදායක ගස නගර සභා මාර්ගයක උරහිසේ පිහිටා ඇති බැවින් එය සභාව මඟින් ඉවත් කිරීමට අනුමැතිය හිමිවිය.

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---:|
| **පුනරාවර්ථන ලැබීම්** | **12,148,441.87** |
| **වෙනත් ලැබීම්** | **2,611,801.27** |
| **මුලු ලැබීම්** | **14,760,243.14** |
| **පුනරාවර්ථන වියදම්** | **9,068,656.14** |
| **වෙනත් වියදම්** | **21,673,206.72** |
| **මුලු වියදම්** | **30,741,862.87** |

2021-03-01 දින සිට 2021-03-31 දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---:|
| 56-1906 | 12,376.00 |
| 37-7933 | 7,976.80 |
| 227-5020 | 32,328.40 |
| RD-8240 | 33,808.64 |
| LL-7688 | 32,568.64 |

| | |
|---|---|
| BC-0005 | 20,800.00 |
| GC 0001 | 6,058.00 |
| GK-6227 | 14,664.00 |
| JD-4684 | 4,110.00 |
| LL-2110 | 14,291.00 |
| PF-4006 | 40,128.00 |
| QL-2901 | 3,014.00 |
| RC-1107 | 24,962.60 |
| | 5,800.00 |
| OV/M 0017 | 5,221.00 |
| RB-4786 | 12,958.40 |
| RD-8000 | 10,124.40 |
| ZA-5039 | 10,124.40 |
| UQ - 1933 | 2,740.00 |
| DDR0008 | 1,560.00 |
| RC1118 | 12,771.20 |
| ZA-9835 | 22,880.00 |
| | 22,880.00 |
| **එකතුව** | **354,145.48** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**10.01** ආචාරිමලේවත්ත මාර්ගය නඩත්තු කිරීම -රු.288,357.66

**10.02** පල්ලෙකුඹුර පාර නඩත්තු කිරීම - රු.204,388.63

**10.03** කරදියමුල්ල ගමගෙදර පාර නඩත්තු කිරීම - රු.267,571.25

**10.04** මුගුණමලේ පාර නඩත්තු කිරීම - රු.146,171.65

**10.05** බෝම්බුව පෙර පාසලේ තීන්ත ආලේප කිරීම - රු.40,860.00

**10.06** කරච්කැටිය ගල්වල මාර්ග පාලම් ඇඳිවැට අලුත්වැඩියා කිරීම - රු.66,525.00

**10.07** බෝම්බුව ප්‍රජා ශාලාව ආර්ථික සංවර්ධන නිළධාරි කාර්යාලයක් සඳහා නිළ කාමරයක් වෙන් කිරීම - රු.49,112.50

**10.08** සඳුන්ගම ධනසිරි මහතාගේ නිවස අසළින් යන මාර්ගය JCB යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම - රු.36,000.00

**10.09** සමගි මාවත ගොරොක්ගහමඩ පල්ලිය අසළ සිට ජලය ලබාදීම සඳහාවන කාණුව කැපීම. - රු.22,500.00

**10.10** බුලත්ගම ට්‍රාන්ස්පෝමරය අසළ ඇති දෙවට පාරේ ආරම්භක කොටස කොන්ක්‍රීට් කිරීම - රු.70,216.28

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඇල්ලෙඅරාව තිලංග කඩය ඉදිරිපිට ප්‍රධාන පාරේ මැදින් යන කාණුවේ ජලය බැසයාමට නොහැකි ලෙස අවහිර වී ඇති බැවින් එය සකස් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බෝම්බුව පුරාණ රජ මහ විහාරයේ පවත්වාගෙන යනු ලැබූ දහම් පාසල මේ වන විට සම්පූර්ණයෙන්ම නතර වී ඇති බවද එබැවින් බෝම්බුව ප්‍රදේශය තුළ විෂමාචාරි සමාජයක් බිහිව ඇති බවද මෙම දහම් පාසල නතර වීමට හේතුව වී ඇත්තේ එම විහාරස්ථ ගොඩනැගිල්ල කඩා වැටීම බවද පවසන ලදී. එමෙන්ම ධනවතුන් බොහෝ දෙනෙකු අවස්ථා කිහිපයකදීම මෙය සකස් කිරීමට උත්සහ ගත් නමුදු කඩාකප්පල්කාරී පිරිසක් විසින් එය නතර කර බවද මේ වන විට හිටපු ගරු නාගරික මන්ත්‍රීවරයෙකු වන ධර්මසේන සමරසිංහ මැතිතුමා මෙය සකස් කරමින් සිටින බවද එවැනි සත් ක්‍රියාවක් කරනු ලබන එම පුද්ගලයාට තම පුද්ගලික ස්තුතිය පිරිනමන බවද පවසන ලදී. එමෙන්ම එම ක්‍රියාව දිරිගැන්වීම පිණිස එම ස්ථානයේ ඇති පස් කන්ද ඉවත් කර ගැනීම සඳහා සභාවේ JCB යන්ත්‍රය සහ ටිපර් රථය ලබා දෙන ලෙස පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ පෙට්ටිගල පාරේ විද්‍යාලෝක විද්‍යාලය අසළ ස්ථානයේ කාණුවේ කැලේ වැවී ඇති අතර කාණු ගොඩ දමා නොමැති බවද මෙය මාර්ග සංවර්ධන අධිකාරිය සතු වන නමුත් මෙහි චෝදනාව නගර සභාවට එල්ලවන බැවින් මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසද පවසන ලදී. කරච්කැටිය මාර්ගයේ උඩකන්ද හන්දියේ සිට ඉදිරියට මාර්ගය අබලන් අතර මෙහි බෑවුම අධික බැවින් කාණුව යොදා ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ද පසුගිය වර්ෂ දෙකෙහිදී ජනතාවට සිංහල අලුත් අවුරුදු සැමරීමට

නොහැකි වූ අතර මෙම වසරේදී හෝ සිංහල හා හින්දු අවුරුදු සැමරීමට සියලු දෙනාට හැකිවේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් කරව්කැටිය පස්වන පටුමගේ කාණුව සම්පූර්ණයෙන්ම ඉදිකර එහි වැඩ අවසන් කළ අතර එතනින් ඉදිරියට කාණුව නොමැති වීම හේතුවෙන් වැසි දිනවලදී ජලය මාර්ගය පුරා ගොස් නිවෙස්වලට යන බැවින් එම ස්ථානයේ කාණුවක් සකස් කරන ලෙසද ඉදිරියට වර්ෂා කාලය එළඹෙන බැවින් මෙය කඩිනම් කරන ලෙසද පවසන ලදී.

එමෙන්ම කුරගල පුද භූමියෙහි ශ්‍රමදානය සඳහා නගර සභා කාර්ය මණ්ඩලයේ සියලු දෙනා එක්ව සහභාගී වීම සුදුසු බවද ඒ සඳහා දිනයක් හැකි ඉක්මනින් යොදා ගන්නා ලෙසද නගර සභාව ඉදිරිපිට කාණුවේ අපද්‍රව්‍ය යෙදීම නිසා ඉතා විශාල දුර්ගන්ධයක් හමන බැවින් මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාව ආරම්භ කළ දින සිටම බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පාඩුන් පිළිබඳ නිතරම සාකච්ඡා කළ අතර අද දින සභාවේදී එහි ප්‍රගතිය පෙන්වූ බව ද ඒ පිළිබඳ ප්‍රශංසා කරන බව ද සඳහන් කරන ලදී. එමෙන්ම බළන්ගොඩ නගරයේ කොන්ක්‍රීට් ස්ලැබ් නොමැති බොහෝ ස්ථාන ඇති බැවින් එම ස්ථාන කඩිනමින් සකස් කරන ලෙසද බළන්ගොඩ නගරය වෙසක් කලාපයක් කිරීමට සූදානම් බැවින් ඒ සඳහා නගර සභාව මඟින් වෙසක් කූඩුවක් නිර්මාණය කිරීම සුදුසු බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මේ දිනවල නගරයේ තැනින් තැන පවතින සේල් කඩ ඉවත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවද සභාව විසින් සේල් කඩ සඳහා අවසර ලබා නොදෙන ලෙසද පවසන ලදී. එමෙන්ම මහජන පොළ වාහන නැවතුම්පලේ ජලය පිරෙන බැවින් එය සකස් කරන ලෙසද බස්නැවතුම්පලේ පින්තාලිය ගුවන් පාලම යට ඉදිකරන ලෙසද බස්නැවතුම්පල සැමතැනම බුලත් කෙළ ගසන බැවින් මේ පිළිබඳව කඩිනමින් පියවරක් ගන්නා ලෙසද එහි වගකීම බුලත් විට අලෙවි කරන්නන්ට ලබා දෙන ලෙසද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ ක්‍රීඩාංගණය ඉදිරිපිට කන්දේ නිවාස ඉදිකිරීමේදී එක සේ ඉදිකිරීමට නිවාස සැලසුම් සකස් කරන කරන ලෙස අදාළ ඉඩම් හිමියන් දැනුවත් කරන ලෙසද පාපන්දු ක්‍රීඩකයින් සඳහා ක්‍රීඩා උපකරණ ගබඩා කර තැබීම සඳහා ක්‍රීඩාගාරයෙන් ස්ථානයක් ලබා දෙන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

## 09. අවසානය

**ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් අද දින සභාවේ සියලු යෝජනා සම්මත කර ගනිමින් සභාවේ කටයුතු සාර්ථක ලෙස කරගැනීමට හැකි වීම පිළිබඳ සතුටුවන බවද හිටපු සභාපතිතුමා හා තමන් අතර ද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා හා තමන් අතර ද අද දින බහින් බස් වීමක් සිදු වූ අතර ඒ පිළිබඳව කණගාටුව පළ කරන ලදී. එමෙන්ම ගිය සභාවාරයේදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවේ කථා කරන අවස්ථාවේදී එක් මන්ත්‍රීවරයෙක් එතුමා පෙන්වා අතින් විවිධ දේ පවසා අනතුරුව එම මන්ත්‍රීවරයාගේ කතාවේදී ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා සභාපති ලෙස වැඩ බලන සමයේදී සභාවේ කාලය නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් කටයුතු කළ බවට පැවසූ අතර තමන් ඒ පිළිබඳව කණගාටුව පළ කරන බව ද තමන් ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසා එම අදහස් වලට ගරු කරමින් කටයුතු කිරීමට කැමති බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා තම රාජකාරි සමඟ ගරු මන්ත්‍රීවරුන් විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ප්‍රශ්නයක් සමඟම තමන් බැඳී සිටියද නිරන්තරයෙන් ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට අවස්ථාව නොලැබෙන බව ද ඒ සඳහා නිළධාරීන් පත් කර තිබෙන බවද එම අවස්ථාවලදී සිදුවන අඩුපාඩු ගරු මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දීම සුදුසු බවද පවසන ලදී.

එමෙන්ම න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යන කොටස පවතිනුයේ නිකරුණේ වල්පල් දෙඩවීමට නොවන අතර න්‍යාය පත්‍රයේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට තරම් අවශ්‍ය සභාව මඟින් ඉටු කර ගත යුතු කාරණා ආදිය සභාව හමුවේ තැබීමට බවද එම අවස්ථාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නිසි ලෙස භාවිතා කරන බවද පවසන ලදී.

ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සියලු දෙනාගේ සිතුම් පැතුම් ඉටුවන නගර වාසීන්ගේ ඕනෑ එපාකම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීමට හැකිවන සුභ නව නවසරක් වේවායි පතමින් අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියලන්ලා මාධ්‍යවේදීන්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පළ කරමින් ප.ව.01.30 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.